කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ

2019 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි

උපදෙස් පරිදි පිළියෙල කර ඇත.

පළමු පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙහි විෂය පථයට 2019.12.10 දිනැති අංක 2153/12 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සමාජ ආරක්ෂණ විෂයයද එක්ව කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය වශයෙන් ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලාංකේය කාන්තා හා ළමා පරපුරේ උන්නතිය උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.09.21 දිනැති අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් නිවේදනයෙන් පවරා දෙන ලද කාර්යයන්, ක්‍රියාවට නැංවීම උදෙසා අදාළ පරිදි අමාත්‍යාංශය වෙත සුවිශේෂී කාර්යය භාරයක් පැවරී ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තිය හා කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් පිටුදැකීම පිළිබඳ සම්මුතියේ සඳහන් කරුණු ඇතුළත් වූ කාන්තා ප්‍රඥප්තිය පාදක කරගෙන ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය, ප්‍රතිපත්ති සකස් කිරීම, වැඩසටහන් මෙහෙයවීම යන කාර්යයන්, අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන විසින් සාර්ථකව ක්‍රියාවට නංවා ඇත. සිය බුද්ධිය ද ශක්තියද උපරිම හා යහපත් ලෙස භාවිතා කරමින් ස්ව ශක්තියෙන් අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකීය කාන්තා පරපුරක් සඳහා උචිත පරිසරයක් නිර්මාණය කර දෙමින් සමාජීය හා ආර්ථික බල ගැන්වීම මඟින් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාන්තා අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වීමද සිදුකර ඇත.

විශේෂයෙන් තිරසර හා තුලනාත්මක සංවර්ධනයක් තුළින් කාන්තා හා ළමා පරපුර සවිබල ගැන්වීම සඳහා දශක ගණනාවක සිට ඉස්මතුව පැවති අවශ්‍යතාවයන් රැසක් ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් ජාතික මට්ටමේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනයන් බොහොමයක් අපේක්ෂිත මට්ටමින් ඉටු කිරීමට අප සමත් වූයෙමු. එතුළින් කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම හා ඔවුන් සංවර්ධනයේ ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස සහභාගී කර ගැනීමටත් සංවර්ධනයේ සාධනීය ප්‍රතිඵල ඔවුන් වෙත ගලායාම තහවුරු කිරීමටත් අවස්ථාවන් නිර්මාණය විය.

ඒ අනුව කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට අදාළව ඔවුන් සඳහා ආදායම් උත්පාදන මාර්ග වශයෙන් ශිල්පීය හා තාක්ෂණික වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීම, සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම, කාන්තා සංවිධාන ජාලය ශක්තිමත් කිරීමේ අරමුණින් ඇතිකර ඇති කාන්තා බල මණ්ඩල තව දුරටත් ශක්තිමත් කරමින් ජාතික බල මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කිරීම, කාන්තාවන් සඳහා ජීවනෝපාය සංවර්ධන ආධාර යටතේ "දිරිය මංපෙත" වැඩසටහන තුළින් ස්වයං රැකියා ව්‍යාපෘති 64 ක් පැවැත්වීම, විදේශගත වන කාන්තාවන්, ගෘහ මූලික කාන්තාවන් හා වතු අංශයේ කාන්තාවන් ආර්ථික වශයෙන් බල ගැන්වීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති හඳුන්වා දීමට කටයුතු කිරීම, "ඇයට දිරියක්-රටට සවියක්" ව්‍යාපෘතිය යටතේ ආබාධිත කාන්තාවන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති 40 ක් ආරම්භ කිරීම, කාන්තා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘති 17 ආරම්භ කිරීමටද හැකිවිය.

එමෙන්ම 2019.04.21 දින ඇතිවූ පාස්කු දින ප්‍රහාරයෙන් විපතට පත්වූ කටාන, වත්තල, මීගමුව, මන්මුනේ උතුර යන ප්‍රදේශවල පවුල් සඳහා ඔවුන් නැවත නගා සිටුවීමට ස්වයං රැකියා ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 1.387 කින් යුත් විශේෂ ස්වයං රැකියා ආධාර ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ද හැකියාව ලැබුණි.

ඉහත කාන්තාවන් සඳහා වූ ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදන ක්‍රියාවලියට අමතරව මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා 2019 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඊට අමතරව ළමුන් ඉලක්ක කරගත් වැඩසටහන් වශයෙන් දිවා සුරැකුම් හා ප්‍රජා පාදක සැදෑ සුරැකුම් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ වෙන් කරන ලද රු.මි 21.25 ක ප්‍රතිපාදන යොදා ගනිමින් 2019 වර්ෂයේදී කෑගල්ල, කහටගස්දිගිලිය, මැදදුම්බර යන ප්‍රදේශයන්හි පෙර පාසැල් දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සමත් විය. එමෙන්ම 2018 සිට ආරම්භ කරන ලද ඒකාබද්ධ ළමා හා කාන්තා ආදර්ශ ගම්මාන පිහිටුවීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේදීද ව්‍යාපෘති යෝජනා අතරින් ව්‍යාපෘති 10 ක් තෝරා ගනිමින් ඊට අදාළ ගම්මානවල සංවර්ධනය විය යුතු අංශ සඳහා ප්‍රතිපාදන ලබාදීම සිදු කරන ලදී. තවද, මුල් ළමාවිය සංවර්ධන ජාතික ප්‍රමිති හඳුන්වාදීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමින් කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ 03 ට අයත් සියළුම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි ගුරුවරුන් මුල් ළමාවිය සංවර්ධන ජාතික ප්‍රමිති සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අමාත්‍යාංශයට හැකිවිය.

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් විශේෂයෙන්ම වතුකරය ද ඇතුළු සමස්ථ දිවයින පුරා පිහිටි සිගිති පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය මූලික කර ගනිමින් අධීක්ෂණය හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා කාර්යයන් රැසක් 2019 වර්ෂය තුළද ඉටුකර ඇත. ඒ යටතේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ ලබාදීම, නියමු පුහුණුකරුවන් පුහුණු කිරීම, කෙටිකාලීන සේවාස්ථ පෙරපාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීමද සිදුකර ඇත.

තවද ප්‍රාදේශීය මට්ටමින් තෝරා ගන්නා ලද අඩු ආදායම් ලාභී පවුල්වල පෙර පාසල් දරුවන් සඳහා එම දරුවන් පෙර පාසැල් අධ්‍යාපනය ලබන කාල සීමාව දක්වාම වන පරිදි මූල්‍යමය ශිෂ්‍යත්ව ප්‍රධානයක් ලබාදීමටද ඒ යටතේ 2019 වර්ෂයේදී පෙර පාසල් දරුවන් 7089 දෙනෙකු සඳහා එම මුදල ලබාදීමටද කටයුතු කර ඇත. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි තිබිය යුතු අවම සුදුසුකම් සම්පූර්ණ කර නොමැති මධ්‍යස්ථාන තෝරාගෙන ඒවායේ පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් සහනාධාර මුදලක් ලබාදීමටද මෙම ව්‍යාපෘතිය මඟින් කටයුතු කරන අතර ඒ යටතේ 2019 වර්ෂයේදී මධ්‍යස්ථාන 1668 ක් සඳහා එම සහනාධාර අරමුදල් ලබාදීමටද කටයුතු කර ඇත.

1.2. දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ළමුන් හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කෙරෙන ඔවුන්ට හිතකර , සංවේදී සමාජයක් බිහි කිරීම

මෙහෙවර

අභිමානවත් දේශයක් වෙනුවෙන් සමාජ ආර්ථික බලගැන්වීම, සමාජ වටිනාකම් ප්‍රවර්ධනය සහ අදාළ සියලු පාර්ශවයන්ගේ උපාය මාර්ගික ඒකාබද්ධ සහභාගිත්වය ලබාගැනීම මඟින් ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.

අරමුණු

- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික සැලැස්මක් සකස් කිරීම.
- කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේම වෙනස් කොට සලකනු ලැබීම ඉවත් කිරීම පිළිබඳ සිඩෝ ප්‍රඥප්තිය ට (CEDAW) අනුව කටයුතු කිරීම.
- තිරසර සංවර්ධන අභිමථාර්ථයන්හි 17 හි 1 වන ඉලක්කය වන දරිද්‍රතාවය සෑම ආකාරයකින්ම සෑම තැනින්ම ඉවත් කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්පත් කර ගැනීම හා කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.
- ආර්ථික, සමාජයීය, අධ්‍යාපනික, දේශපාලනික හා සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් භුක්ති විදීමට අවස්ථාව සලසා දීම.
- කාන්තාවන්ට සම අයිතිවාසිකම් හා සම අවස්ථා තහවුරු විය යුතු අංශ හඳුනා ගැනීම, ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට සහය දීම සහ ඒ සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම බලාත්මක කිරීම.
- අනාරක්ෂිත කාන්තා පවුල් සංවර්ධනය.
- ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා වන ජාතික ප්‍රතිපත්තියට අනුව කටයුතු කිරීම.
- ළමා හා කාන්තා සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, විදේශ ආයතන සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය කරමින් ළමා හා කාන්තා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ළමා හා කාන්තා ආරක්ෂණය සහ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය සහ ඊට අයත් නියෝජිත ආයතන මඟින් සිදුකරනු ලැබූ ආරක්ෂණ සහ සංවර්ධන වැඩ සටහන් අධීක්ෂණය කිරීම.
- ළමුන් හා කාන්තාවන් සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව බැඳීසිටින සියලුම ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවයන් සඳහා නීති, ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය.
- ළමා අපයෝජනය පිටු දැකීමෙහිලා අවශ්‍ය නෛතික හා ජාතික ප්‍රතිපත්තීන්ගෙන් සැදි පරිසරයක් ස්ථාපිත කිරීම. (ප්‍රාදේශීය ළමා ආරක්ෂක තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම - 2018 – 2020)
- ඉහළ ගුණාත්මක භාවයකින් යුතු මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවාවක් තහවුරු කිරීම.
- නිවාසගත ළමුන්ගේ සුබසාධනය උදෙසා අයිතිවාසිකම් තහවුරු කිරීම හා ඔවුන් සමාජගත කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීම හා අවම කිරීම.
- ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීති හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම.
- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- 2015 – 2030 තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ප්‍රමුඛ ඉලක්කයක් වන්නේ සෑම කාන්තාවකටම හා දරුවෙකුටම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විභේදනයෙන් තොරව සම සාධාරණත්වයෙන් යුතුව ජීවත්වීම සඳහා සමාජීය ආර්ථිකය සහ නීතිමය වශයෙන් පවතින බාධක ඉවත් කිරීම සහ ඒ සඳහා සවිබල ගැන්වීමයි.

- කාන්තාවන්ට එරෙහිව සිදුවන සියළු ආකාරයේ වෙනස්කම් පිටු දැකීමේ ජාත්‍යන්තර සම්මුතිය (CEDAW), ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තිය (CRC), එක්සත් ජාතීන්ගේ මහා සංගමයේ 67 වන සැසිය (UNGA), ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම (CSW), මානව හිමිකම් කවුන්සිලයේ 21 වන සැසිය, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම, 2005 අංක 34 දරණ ගෘහස්ත හිංසන වැළැක්වීමේ පනත සහ ශ්‍රී ලංකා මානව හිමිකම් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම වැනි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතීන් හා ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශ්වකරුවෙකු ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටි.

ඒ යටතේ,

- කාන්තාවන් එකම ජාලයක් තුල සංවිධානය කිරීම, ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන්ද සමාජීය වශයෙන්ද බල ගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම.
- සියළුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ථ සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණ දෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- විදේශගත කාන්තාවන්, වතු අංශයේ කාන්තාවන්, ආබාධිත කාන්තාවන් හා සුවිශේෂ හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- සමස්ථ කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා ප්‍රජාමූල මට්ටමේ සිට ජාතික තලය දක්වා දිවෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ළමා හා කාන්තා ක්ෂේත්‍රයට අදාළ ජාතික සැලසුම් සම්පාදනය කිරීම
- ළමා අපයෝජන හා සියළුම ආකාරයේ කාන්තා හිංසන වැළැක්වීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනයට අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීම
- මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන වැඩසටහන් පැවැත්වීම

අමාත්‍යාංශය සතු ප්‍රධාන කාර්යයන් වේ.

1.4 සංවිධාන සටහන



ලේකම්
රාජ්‍ය ලේකම්
අතිරේක ලේකම් (පාලන) SLAS
ප්‍රධාන මූල්‍ය නිලධාරී SLAccS
අතිරේක ලේකම් (සංවර්ධන) SLAS
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් SLAS (පාලන)
ප්‍රධාන ගණකාධිකාරී SLAccS
අධ්‍යක්ෂ (සංවර්ධන) SLAS
අධ්‍යක්ෂ (සැලසුම්) SLPS
අධ්‍යක්ෂ (කාන්තා කාර්යාංශය) SLAS
අධ්‍යක්ෂ (ළමා ලේකම් කාර්යාලය)
ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) SLAccS
ජාතික කාන්තා කමිටුව
ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය
පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය
සහකාර ලේකම් (පාලන) SLAS 1
නීති නිලධාරී (දෙපාර්තමේන්තු)
ගණකාධිකාරී (2)SLAccS ii/iii
ළමුන් සඳහා වූ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය
නි.අ. / ස.අධ්‍යක්ෂ (සංවර්ධන) SLAS (1)
නි.අ. / ස. අධ්‍යක්ෂ (සැලසුම්) SLPS (2)
නි.අ. /ස.අ. (දෙපාර්තමේන්තු) (2)
නි.අ. /ස.අ. SLAS (2)
නි.අ. /ස.අ. (දෙපාර්තමේන්තු) (1)
නි.අ. /ස.අ. (දෙපාර්තමේන්තු) SLAS (2)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
සහාය කාර්ය මණ්ඩලය

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ



1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනග/ අරමුදල්

අරමුදල	අරමුණ	දායකත්වය/පැවරීම
දරුවන් සුරකිමු	විවිධ හේතූන් මත අසරණ වී සිටින දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා පිහිටුවීම	➢ රු. 1,7014,855.13 ක් පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය ➢ දිරිදරු සම්පත ලොතරැයි අළෙවි ආදායමෙන් 10% ක මුදලක් අදාළ අරමුදල සඳහා දායක වේ
දිරිය කාන්තා (120 -02-03-17-2509)	කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීම	කොළඹ, මාතර හා මඩකලපුව රැකවරණ මධ්‍යස්ථාන පරිපාලන වියදම් අමාත්‍යාංශය විසින් දරණ අතර පරිපාලනය කාන්තා පිහිට (Women in Need) ආයතනයට පවරා ඇත
කාන්තා සවිය (120 – 02- 03 – 06 - 2509		ගම්පහ (මීරිගම) පරිපාලන වියදම් අමාත්‍යාංශය (කාන්තා කාර්යාංශය) විසින් දරණ අතර ගොඩනැගිල්ල බස්නාහිර පළාත් සභාව සතුයි
දිරිය කාන්තා (120 -02-03-17-2509)		යාපනය හා මුලතිවු දිස්ත්‍රික්කය පරිපාලන වියදම් අමාත්‍යාංශය විසින් දරණ අතර පරිපාලනය යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානයට (Jaffna Social Action Center) පවරා ඇත.
කාන්තා සවිය (120 – 02- 03 – 06 – 2509)		රත්නපුරය කාන්තා කාර්යාංශය

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම	ව්‍යාපෘති කාල සීමාව
සාර්ක් නියෝජිත රටවල කාන්තා හා ළමා උපකාරක නිදහස් දුරකතන සේවාව	සාර්ක් සංවර්ධන අරමුදල	රු.මි.27.472	අවුරුදු 03
ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව, ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති හිමිකම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සඳහා වූ ව්‍යාපෘතිය	එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල	රු.මි.1.253	වසර 01 (2019.01.01 – 2019.12.31)
මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය	ලෝක බැංකුව	ඩොලර් මිලියන 50	2015 - 2021

දෙවන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකයේ 06 වන කොටසේ "දෙමව්පියන් විවාහකද" යන කොටස සංශෝධනය කරමින් 2019 වර්ෂයේ සිට අදාළ කොටස උප්පැන්න සහතිකයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම

අභියෝග හා ඉදිරි ඉලක්ක

අභියෝග

1. අමාත්‍යාංශය යටතේ පවතින ජාතික කාන්තා කමිටුව ස්ථාපිත කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් පමණක් හිමිවී ඇති බැවින් පවතින නීතිමය බලතල අඩුවීම.
2. ගෘහස්ත හිංසන පනත වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය නොවීම නිසා පනත ක්‍රියාත්මක කිරීමේදී බාධා පැවතීම
3. 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව පැය 08 ක් පමණක් ක්‍රියාත්මක වීම
4. කාන්තා හිංසනයන් අවම කිරීම හා කාන්තාවන් සවිබල ගැන්වීමට කටයුතු කිරීමේදී දැනට පවතින නීති හා ප්‍රතිපත්ති ප්‍රමාණවත් නොවීම.
5. දිවයිනේ ආරක්ෂාව සම්බන්ධව උද්ගත වූ තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

ඉදිරි ඉලක්ක

1. ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත සංශෝධනය නීතිගත කිරීම
2. 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා පැය 24 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කිරීම
3. පර්යේෂණ දියත් කිරීම මඟින් අදාල අවශ්‍යතා හඳුනා ගැනීම හා එමඟින් නීති, ප්‍රතිපත්ති සකස් කිරීමට කටයුතු කිරීම.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
කාන්තා, ළමා කටයුතු සහ සමාජ
ආරක්ෂණ අමාත්‍යාංශය
05 වන මහල.(දෙවන අදියර) ....
බත්තරමුල්ල.

ප්‍රා.ලේ/ ග.නි/ ආයතන ප්‍රධානියාගේ අත්සන

තෙවන පරිච්ඡේදය

2019.12.31 දිනෙන් අවසන්
වූ වසර සඳහා වන සමස්ත
මූල්‍ය කාර්ය සාධනය

ඒසීඑ-එ1

ඇමුණුම 01

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2019		සටහන	සත්‍ය 2019	සත්‍ය 2018
-	ආදායම් ලැබීම්		-	-
-	ආදායම් බදු	1	-	-
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-
-	ආදායම් නොවන ලැබීම්		-	-
-	භාණ්ඩාගාර අග්‍රිම		1,022,757,397	904,671,322
-	තැන්පතු		3,234,818	3,046,613
-	අත්තිකාරම් ගිණුම්		29,063,376	27,836,389
-	වෙනත් ලැබීම්		41,498,755.25	18,500,147
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		1,096,554,347	954,054,471
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		1,096,554,347	954,054,471
	අඩුකළා : වියදම්			
-	පුනරාවර්තන වියදම්		-	-
638,260,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	630,970,778	601,028,347
256,834,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	244,623,706	233,979,372
6,198,900,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	5,891,297,365	6,011,817,195
-	පොළී ගෙවීම්	8	-	-
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-
7,093,994,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		6,766,891,850	6,846,824,913
	මූලධන වියදම්			
8,850,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	7,372,518	10,754,494
4,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	1,586,612	2,345,391
60,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	40,720,000	31,180,000
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-
3,300,000	හැකියා වර්ධනය	14	1,821,729	1,958,457
1,509,540,000	වෙනත් මූලධන වියදම්	15	1,499,638,802	1,104,644,713
1,585,690,000	**මුළු මූලධන වියදම් (ඉ)**		1,551,139,660	1,150,883,055
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		-	-
	තැන්පතු ගෙවීම්		2,526,159	2,724,361
	අත්තිකාරම් ගෙවීම්		39,509,727	25,243,251
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		8,359,867,396	8,025,675,580
	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		(7,263,313,050)	(7,071,621,109)

ඇමුණුම 02

2019.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2019 (තතය)	2018
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	342,540,860	290,380,661
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	72,623,444	62,222,007
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		415,164,304	352,602,668
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		70,916,188	61,223,411
දේපළ පිරියත හා උපකරණ සංචිතය		342,540,860	290,380,661
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	1,707,255	998,597
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		415,164,304	352,602,668

පිටු අංක..........සිට .... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .... සිට .... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.... ඒ. එස්. එම්. එස්. මහානාම..........
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2020/02/25

ලේකම්
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
05 වන මහල, (සුවන අදියර) සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ගණන්දීමේ නිලධාරි
තනතුර :
දිනය :

....
ඒ. පී. කොඩිකාර
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2020/02/25

ඒසීඒ-සී

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2019 රු.	2018 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,051,795,759	923,171,469
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,051,795,759**	**923,171,469**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>	-	
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	870,265,396	818,390,866
සහනාධාර සහ මාරුකිරීම්	8,036,175	7,535,480
මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,563,251	14,653,814
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**880,864,822**	**840,580,160**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**170,930,938**	**82,591,309**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	170,930,938	82,591,309
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**170,930,938**	**82,591,309**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(170,930,938)**	**(82,591,309)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ)	-	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

1. <u>වාර්තාකරණ කාල පරිච්ඡේදය</u>

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

2. <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. <u>ආදායම් හඳුනා ගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසලකා, ගිණුම් කාල සීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4. <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	නැත				

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	7,093,994,000	7,096,098,000	6,766,891,849	95%
ප්‍රාග්ධන	1,585,690,000	1,847,093,000	1,551,139,660	84%

ඇමුණුම 05

මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ වලින් ලද ප්‍රතිපාදන . (000)

ප්‍රතිපාදන ලද් අමාත්‍යාංශය	අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් ප්‍රතිපාදන වල % ලෙස
		මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
ජනාධිපති ලේකම් කාර්යාලය	ජන පවුර වැඩසටහන		6,586	6,577	100%
ජාතික හා ප්‍රතිපත්ති ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය	අභ්‍යසලාභී උපාධි ධාරීන්ට දීමනා ගෙවීම		8,938	8,641	97%
	මෙහෙයුම් කල්බදු යටතේ මිලදීගත් වාහන සඳහා කල්බදු වාරික		6,000	5,370	89%
	යටිතල පහසුකම් සංවර්ධනය		150,000	2,590	2%
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය අයකිරීම		640	640	100%
ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය	කාන්තාවන් හා ළමුන් සඳහා ආරක්ෂිත සබැඳි පරිසරයක්		35.203	35.203	100%

ඇමුණුම 01 (42)

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

(000)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිතය	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ		342,540,860		
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

Miss Thushan

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VTY/C/MWCA/02/18/24   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2019 අගෝස්තු 05 දින

ලැබුණා / RECEIVED ලේකම් කාර්යාලය 05 AUG 2019 කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

ගිණුම් අංශය 06 AUG 2019 ලැබුණා

ලේකම්

කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යෝජිත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා

සහකාර විගණකාධිපති

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තිය විනිශ්වය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය, ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

(අ) මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
අංක 120-02-03-20-2509 දරන හා අංක 120-02-04-15-2509 දරන වැය විෂයයන් ගේ අරමුණුවලට පටහැනිව කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.1,638,790 ක් වැය කර තිබුණි.	මූලධන වත්කම් අත්පත් කර ගැනීමට දරන වැය අදාල ප්‍රතිපාදන යටතේ දැරිය යුතු බව හා අදාල වැය විෂයයන්ගේ අරමුණු සඳහා දරන වියදම් එම වැය විෂයයන් යටතේ දැරිය යුතු බව.	සංවර්ධන වැඩසටහන් සඳහා මිලදී ගන්නා බැවින් අදාළ වියදම් මෙම වැය විෂයය යටතේ දරා ඇත.

(ආ) අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලැබුණු අග්‍රිම එකතුව රු.892,679,098 ක් වුවද, මූල්‍ය කාර්යසාධන වාර්තාවේ එය රු.904,671,322 ක් ලෙස සඳහන් කිරීම හේතුවෙන් රු.11,992,224 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතු බව.	භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද වරද නිවැරදි කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
හානි පිළිබඳ ලේඛනය මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතු බව.	පිළිතුරු ලැබී නොමැත.

1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය			නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	**වටිනාකම** රු.	**අනුකූල නොවීම**		
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
i. මුදල් රෙගුලාසි 633	6,336,399	සහරා, අත්පත්‍රිකා හා පොත් බැඳීම් අදාල රෙගුලාසි ප්‍රකාරව රජයේ මුද්‍රණාලය මගින් සිදු කරවා ගැනීමකින් තොරව පෞද්ගලික මුද්‍රණාල මගින් සිදුකර ගෙන තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පිළිතුරු ලැබී නොමැත.

5

ii. මුදල් රෙගුලාසි 103 (1) (ඊ)	13,902,198	අවස්ථාවන් 3 කදී සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් සිදු වූ අලාභ හානි අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පසුව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	-	අමාත්‍යාංශයේ ලේකම්වරු දෙදෙනෙකු විසින් තමන්ගේ සේවා කාලය තුළ වාහන දෙක බැගින් භාවිතා කර තිබුණි.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු බවට අවධාරණය කළ යුතු වීම.	මෙම අමාත්‍යාංශයේ රාජකාරි කළ පූර්වගාමී ලේකම්වරුන් විසින් පවත්වා ගෙන එන ලද ක්‍රියාදාමයකි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.	නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.	අවශ්‍යතා මතු නොවීම, දේශපාලන වාතාවරණය, ළමා ආරක්ෂක අධිකාරියේ පැවති පරිපාලනමය ගැටළු මෙම ඉතිරිවීම් සඳහා හේතු වී ඇත.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 3 ක් සඳහා රු.367,500,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර, වර්ෂය අවසාන වන විට ඉන් රු.54,741,448 ක් වියදම් නොකර ඉතිරි වී තිබුණි.	නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.	ශක්‍යතා අධ්‍යයනයේ දී ප්‍රායෝගික ගැටළු මතු වීම, පෙර පාසල් හඳුනා ගැනීම හා තොරතුරු ලබා ගැනීම සඳහා කාලයක් ගත වීම, ළමා ආරක්ෂක අධිකාරියේ පැවති පරිපාලන ගැටළු යනාදී කරුණු මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාල අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි.	දැක්ම හා මෙහෙවරට අනුකූලව කටයුතු කළ යුතුය.	පිළිතුරු ලැබී නැත.

3.2 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අදාල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේ දී නිවැරදිව පිළියෙල කරනු ලැබේ.

7

3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ගොවිජන මන්දිරයේ කොටසක දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ අවශ්‍ය උපකරණ ලබා දීම සඳහා රු.මිලියන 1.5 ක ප්‍රතිපාදිත මුදලින් රු.1,257,000 ක් පාර්ලිමේන්තු මහලේකම් වෙත 2018 සැප්තැම්බර් යවා තිබුණු අතර, එම මුදල් අදාල කාර්යය සඳහා යෙදවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.	ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතා වයකින් භාවිතා කළ යුතු වීම.	පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ..
(ආ)	විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක ප්‍රතිලාභීන් 81 ක් සඳහා රු.මිලියන 2 ක ප්‍රතිපාදන සලසා තිබුණ අතර, ඉන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 ක ව්‍යාපෘති 55 ක් ආරම්භ කර තිබුණේ අවසාන කාර්තුවේ ය.	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යක්ෂමව කටයුතු කළ යුතුය.	පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	කාන්තාවන් හා දරුවන් සඳහා ක්ෂණික සහන ලබා දීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 3 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ අතර, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිලාභීන් 6 දෙනෙකු සඳහා පමණක් රු.378,329 ක ප්‍රතිලාභ ලබා දී තිබුණි.	ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ලෙස ප්‍රතිපාදන, උපරිම කාර්යක්ෂමතා වයකින් උපයෝජනය කළ යුතු වීම.	ප්‍රතිලාභීන් ඉල්លුම් නොකරන ලදී.
(ඈ)	ගරු රාජ්‍ය අමාත්‍යතුමිය 2018 සැප්තැම්බර් 27 වන දින ඉල්ලා අස් වී තිබුණු අතර, අංක 120-1-11-1409 දරන රාජ්‍ය අමාත්‍යාංශ වැය විෂයය යටතේ රු.350,000 ක් වියදම් කර ඔක්තෝබර් 11 දින අමාත්‍යවරයා සඳහා කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබුණි.	නිවැරදි වැය විෂයයන් යටතේ වියදම් දැරිය යුතුය.	රාජ්‍ය අමාත්‍යතුමියගේ ධූරයෙන් ඉල්ලා අස් වීමෙන් පසුව එම තනතුරේ කටයුතු ද අමාත්‍යතුමිය විසින් ආවරණය කරන ලදී.

8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ)	එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලින් (UNFPA) ක්‍රියාත්මක වන ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ දත්ත පද්ධතියක් ශක්තිමත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.22,800,000 ක් වෙන් කර තිබුණ ද, 2018 වර්ෂයේ 3 වන කාර්තුවේ රු.1,098,455 ක් ලැබී තිබූ අතර, ඉන් රු.72,693 ක් පමණක් වියදම් කර තිබුණි.	අරමුණු ඉටුවන සේ ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කළ යුතුය.	දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය වැඩමුළු සංවිධානය කිරීමට සැලසුම් කළ ද, පැවති දේශපාලන වාතාවරණය මත මෙම වැඩසටහන් පැවැත්විය නොහැකි විය.
(ඊ)	දිරිය කාන්තා වැඩසටහන යටතේ කාර්යයන් 3 ක් හා ජාතික කාන්තා කමිටුවේ කාර්යයන් 4 ක් සඳහා රු.මිලියන 9.56 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2.22 ක් පමණක් වැය කර තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 10 සිට සියයට 40 දක්වා අඩු මට්ටමක පැවතුණි.	අරමුණු ඉටුවන සේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය.	පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
(උ)	එදිනෙදා ජීවිතයේ දී කාන්තාවන්ට සිදුවන හිංසනය හා පවතින අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දීම සඳහා අවබෝධයක් ලබා දීමත්, යම් ආකාරයක සහනයක් ලබා දීමත් ආදී අරමුණු කර ගෙන කෘතියක් එළිදැක්වීමට රු.200,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සංකල්ප පත්‍රිකාවට අනුව 2018 මාර්තු වන විට කෘතිය එළිදැක්වීමට හා පිටපත් 1,000 ක් මුද්‍රණය කිරීමටද අපේක්ෂා කර තිබුණි. මෙම කාර්ය සඳහා රු.180,550 ක් වියදම් කර තිබුණ ද, 2019 මැයි 20 විගණන දින වන විටත් පිටපත් 350 ක් පමණක් බෙදා හැර තිබුණි.	අපේක්ෂිත අරමුණු ඉටුවන සේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වීම.	පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

9

3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	පාරිසරික සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා කාන්තාවන් දිරිගැන්වීම සහ ඔවුන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 4 ක ප්‍රතිපාදන සලසා ගෙන අලෙවි මධ්‍යස්ථාන 2 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද, රු. මිලියන 1.01 ක් වැය කර එක් මධ්‍යස්ථානයක් පමණක් ඉදිකර තිබුණි. 2017 වර්ෂයේ රු. මිලියන 5.47 ක් වැය කර අලෙවි මධ්‍යස්ථාන 2 ක් ඉදිකර තිබුණ ද, විගණිත දිනය වූ 2019 මැයි 08 දින වන විටත් එක් මධ්‍යස්ථානයක් පමණක් විවෘත කර තිබුණි.	අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ)	අවදානමට ලක් වූ කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් සඳහා සහන සැලසීම අරමුණු කර ගෙන රු. මිලියන 3 ක ප්‍රතිපාදන සලසා ගෙන වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, එම වැඩසටහන් ඉටු නොකර පවුල් 31 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම සඳහා රු. මිලියන 0.93 ක් වැය කර තිබුණි.	ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රතිපාදන ලබා ගත් අරමුණු වෙනුවෙන් මුදල් වැය කළ යුතු වීම.	පිළිතුරු පසුව යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	තිරසාර කෘෂි ව්‍යාපෘතිය යටතේ 2017/2018 වර්ෂවල රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 කට යවා තිබූ අතර, මෙම ප්‍රතිපාදනවලින් රු. 296,950 ක් හා අය කරගත් වාරික රු. 938,457 ක් නිසි අනුමැතියකින් තොරව කාන්තා බලමණ්ඩල යටතේ ආරම්භ කරන ලද කෘෂි ගිණුම් 19 ක තැන්පත් කර තිබුණි.	නිසි අනුමැතියකින් තොරව ආරම්භ කළ ගිණුම්වල මුදල් තැන්පත් නොකළ යුතු බව.	ඉදිරියේ දී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ආ)	සංචාරක අමාත්‍යාංශය මඟින් සිදුකරවා ගැනීමට නියමිතව තිබූ අම්පාර දිස්ත්‍රික්කයේ පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කාර්යය ප්‍රාදේශීය ලේකම්ගේ හෝ සංචාරක අමාත්‍යාංශයේ කිසිදු ඉල්ලීමකින් තොරව මෙම අමාත්‍යාංශය භාර ගෙන 2017 හා 2018 වර්ෂවල දී ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.මිලියන 5.5 ක් වැය කර තිබුණි.	නිසි අධිකාරී බලයකින් තොරව ගනුදෙනුවලට නොඑළැඹිය යුතු බව.	සංචාරක අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබා දීම සිදු නොකරන ලදී.

11

3.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) කාන්තා ගීතය ප්‍රතිනිර්මාණය කිරීම හා ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.2,688,400 ක් වියදම් කර තිබූ අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පරීක්ෂාවේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.3.6 වගන්තිය, 2.6.1 (අ) (ii) හා 2.8.1 (ආ) වගන්ති ප්‍රකාරව වාර්තා තබා නොගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සමාලෝචනය හා අනුමත නොකිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබීම හා විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රවීන සාමාජිකයකු සහභාගී කරවාගෙන නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය.	දක්වන ලද දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
(ආ) ලෝක ළමා දින ජාතික උත්සවය සඳහා සහරා මුද්‍රණය, ආහාරපාන, වේදිකා සැරසිලි සහ බෑග් මිලදී ගැනීම සඳහා රු.2,437,000 ක් වැය කර තිබුණ අතර, එම ප්‍රසම්පාදනයේ දී ප්‍රසම්පාදන කමිටු තීරණ නොගැනීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කර නොතිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය.	පිළිතුරු ලැබී නැත.

12

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.7 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවය පැවැත්වීම සඳහා දිරිය කාන්තා වැය විෂයය යටතේ රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. වේදිකා නිර්මාණය, ශබ්ද විකාශන හා මාධ්‍ය කටයුතු සඳහා ද, ආහාරපාන සඳහා ද, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත බැදීම් පත්‍ර මඟින් ප්‍රතිපාදන යැවීම සඳහා වූ බාහිර ක්‍රියාකාරකම් වෙනුවෙන් රු.මිලියන 8.78 ක් වැය කර තිබුණි. කාන්තාවන් මුහුණපාන බරපතල සමාජීය හා ආර්ථික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තිරසාර ක්‍රමෝපායන් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම සඳහා මෙම මුදල් වැය කළ හැකිව තිබුණි.	අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුවීම.	පිළිතුරු ලබා දී නොමැත.

3.8 වත්කම් කළමණාකරනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2015 වර්ෂයේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිතුමියගේ කාර්යයන් සඳහා ලබා දී තිබූ මෝටර් රථයක් එම වර්ෂයේදීම අනතුරට භාජනය වී තිබුණු අතර, විමර්ශන වාර්තාවට අනුව මෙම වාහනය අනතුරට පත්වන අවස්ථාවේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික රියැදුරෙකු වාහනය ධාවනය කර තිබුණි. එම වාහනය	රජය සතු වත්කම් නිසි අධිකාරී බලයකින් යුතුව භාවිතා කළ යුතු වීම.	අදාල නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

13

වෙනත් මන්ත්‍රීවරයෙකුගේ භාවිතය සඳහා යෙදවීම පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී නොතිබුණු බවත් විමර්ශන වාර්තාවෙන් තහවුරු විය.		
(ආ) අමාත්‍යාංශය සතු වාහන 17 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි.	විධිමත් පරිදි පැවරීමේ කටයුතු සිදු කිරීම හෝ එම වාහන නැවත ලබා ගෙන සුදුසු පරිදි කටයුතු කිරීම.	පැවරීමේ කටයුතු ඉතා කඩිනමින් සිදු කරන බව.
(ඇ) අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි පවරා නොගත් ඉඩමක රු.මිලියන 25 ක් වැය කර 2001 වර්ෂයේ දී බියගම කාන්තා නේවාසිකාගාරයක් ඉදිකර තිබූ අතර, 2019 මැයි 20 විගණන දින වන විටත් එම ඉඩම පවරා ගෙන නොතිබුණි.	පවරා ගැනීමට/ පවරා දීමට කටයුතු කළ යුතුවීම.	පවරා දීමේ කටයුතු සිදුවෙමින් පවතී.
(ඇ) මෙම අමාත්‍යාංශය විසින් භාවිතා කරන වෙනත් අමාත්‍යාංශ සතු වාහන 13 ක් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම.	පවරා දීමේ කටයුතු සිදුවෙමින් පවතින බව.

සිව්වන පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
ඒකාබද්ධ ආදර්ශ ගම්මාන හා කාන්තා හිතකාමී ආදර්ශ ගම්මාන සංඛ්‍යාව	100%		
පාරිසරික කර්මාන්තය තුළ කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඉදිකල අළෙවි මධ්‍යස්ථාන සංඛ්‍යාව		70%	
තොරතුරු තාක්ෂණය පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව, දත්ත විශ්ලේෂණය හා වාර්තා කිරීම් සංඛ්‍යාව, ජාලකරණ නඩත්තුවන් හා පරිපාලන ප්‍රමාණය, කාර්යාලයීය වෛරස් ආරක්ෂණ මෘදුකාංග යාවත්කාලීන කිරීම් සංඛ්‍යාව, ජංගම යෙදවුම සංවර්ධන ප්‍රමාණය	100%		
මාධ්‍ය සාකච්ඡා සංඛ්‍යාව, රූපවාහිනී වැඩසටහන් සංඛ්‍යාව, පූර්ව ප්‍රචාරක පට සංඛ්‍යාව			50%
ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණ වැඩසටහන් සංඛ්‍යාව			
ළමා හා කාන්තා සංවර්ධන ඒකක සංඛ්‍යාව	100%		
කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා වූ ව්‍යාපෘති සංඛ්‍යාව	90%		
කාන්තා හා ළමා හිංසන අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා පැවැත්වූ දිස්ත්‍රික් කමිටු රැස්වීම් ප්‍රමාණය	100%		
ඉදිකල පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ සංඛ්‍යාව	95%		
කාන්තා රැකවරණ නිවාස පරිපාලනය හා නඩත්තුව සඳහා සැකසූ මාර්ගෝපදේශ ප්‍රකාශන සංඛ්‍යාව			
වියළි කලාප සංවර්ධන සඳහා වූ ප්‍රතිසංස්කරණ කෘෂි මාර්ග සංඛ්‍යාව, කෘෂි ආම්පන්න බෙදාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව			50%
ප්‍රති ආශ්‍රිත ජල පද්ධති ව්‍යාපෘති සංඛ්‍යාව			50%
එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක දිස්ත්‍රික් උපදේශන හා ප්‍රාදේශීය උපදේශන රැස්වීම් සංඛ්‍යාව, පුහුණුවීම් සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය වැළැක්වීමේ සම්බන්ධීකරණ රැස්වීම් සංඛ්‍යාව	90%		

පස්වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG)

1.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
1. සියලු තන්හි පවතින සෑම ආකාරයක ම දුගීබව අවසන් කිරීම (SDG 01)	1. ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූල වන පරිදි සියලුම ආකාරයේ දිරිද්‍රතාවන් ගෙන් පෙළෙන සියලු වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරිම (1.2) 2. දරිද්‍රතාව තුරන් කිරිමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරිමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබද සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම(1 b)	1.ස්වයංරැකියා ආධාර ලබාදුන් කාන්තාවන් ගණන 2. ආදායම් උත්පාදන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 3. පාරිසරික සංචාරක කර්මාන්ත ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද කාන්තා නිෂ්පාදන විකුණුම් මධ්‍යස්ථාන ගණන 3. ගෘහමූලික කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදුන් කාන්තාවන් ගණන 4.කාන්තා හිතකාමී ආදර්ශ ගම්මාන ව්‍යෘපෘතිය යටතේ සිදුකරන ලද ආර්ථික හා සමාජීය මැදිහත්වීම් 5. "අවධානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම්" වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදුන් ළමුන් ගණන 6. අධ්‍යාපන ආධාර, වෛද්‍ය ආධාර, නිවුන් දරු ආධාර හා ශිෂ්‍යත්ව ලබාදුන් ළමුන් ගණන			√
2. සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිත භාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (SDG 02)	අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටිබව සහ ක්ෂය විම පිළිබද අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ළඟාකර ගැනිම ද ඇතුළත්ව 2030 වන විට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහුණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුදුගලයන්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබාදීම (2.2)	" පෝෂණ දීමනාව" වැඩසටහන යටතේ රු.20000ක දීමනාව ලබාගත් ගර්භනී හා කිරිදෙන මව්වරු ගණන 2. "උදෑසන ආහාර වේල" වැඩසටහන යටතේ උදෑසන පෝෂණීය ආහාර වේලක් ලබා දුන් පෙර පාසල් දරුවන් ගණන			√

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
3. පරිපූර්ණ සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම (SDG 04)	2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම (4.2)	1.“ළමා දිරිය” වැඩසටහන යටතේ රු.250 ක මාසික දීමනාවක් ලබා දුන් පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව 2.“ඉගෙනුම් කව ” සංකල්ප ප්‍රවර්ධනය කරන ලද පෙර පාසල් ගණන			√
	ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, සියලු දෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයන් තහවුරු කර දීම (4 a)	1. අලුතින් ඉදි කරන ලද හා අළුත්වැඩියා කරන ලද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගණන (වතුකරයද ඇතුළත්ව) 2. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආධාර ලබා දුන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගණන(වතුකරයද ඇතුළත්ව) 3.පළාත් මට්ටමින් ඉදි කරන ලද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගණන 4.මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ලබා දුන් ඉගෙනුම් හා ඉගැන්වීම් කට්ටල ගණන 5. අළුතින් ඉදි කරන ලද හා වැඩි දියුණු කරන ලද සෙල්ලම් මිදුල් ගණන 6.“ නිවැරදි ආරම්භයට” මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් හඳුන්වා දීම සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන			√

<table>
<tr><th rowspan="2">ඉලක්කය/ අරමුණ</th><th rowspan="2">ඉලක්ක</th><th rowspan="2">ජයග්‍රහණ දර්ශක</th><th colspan="3">මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය</th></tr>
<tr><th>0% - 49%</th><th>50% - 74%</th><th>75% - 100%</th></tr>
<tr><td></td><td>2030 වන විට අන්තර්ජාතික සහයෝගය තුළින් සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ගුණාත්මක වශයෙන් ඉහළ ගුරුවරුන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම (4 c)</td><td>1.මුල් ළමා විය සංවර්ධනය පිළිබඳව පුහුණු කරන ලද නියමු පුහුණු කරුවන් ගණන,

2.“වැලි කෙළියෙන් පිටු අතරට” ළමා හිතකාමී අධ්‍යාපනය පිළිබඳව පවත්වන ලද පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ ගුරුවරු ගණන
3.“ධනාත්මක ශික්ෂණය” පිළිබඳව පුහුණු කරන ලද ගුරුවරු සංඛ්‍යාව</td><td></td><td></td><td>√</td></tr>
<tr><td rowspan="2">4). ස්ත්‍රී පුරුෂ සමානාත් මතාවය ලගාකර සියලු කාන්තාව න් හා ගැහුණු ළමුන් සවිබල ගැන්වීම (SDG 05)</td><td>කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියළුම ස්ථානයන්හි සිදුවන්නාවූ සියළුම ආකාරයේ වෙනස්කොට සැලකීම තුරන් කිරීම (5.1)</td><td>1.අලුතින් ඉදි කරන ලද හා වැඩිදියුණු කරන ලද ළමා හා කාන්තා සංවර්ධන ඒකක ගණන
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනයන් අවම කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදු කරන ලද වැඩසටහන් ගණන
3. කාන්තා රැකවරණ නිවාස වෙත පැමිණි ප්‍රතිලාභීන් ගණන</td><td></td><td></td><td>√</td></tr>
<tr><td>මානව කුට්ටනය, ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට හා ගැහුණු ළමුන්ට එරෙහිව පොදු හා පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියළුම ආකාරයේ ප්‍රචන්ඩත්වයන් තුරන් කිරීම (5.2)</td><td>1. 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව හා 1929 ළමා උපකාරක දුරකතන සේවාව 2. ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනතේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදු කරන ලද ප්‍රතිපත්තිමය සාකච්ඡා හා දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන</td><td></td><td></td><td>√</td></tr>
</table>

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
		3. පොදු ප්‍රවාහනයේදී සිදුවන ලිංගික හිංසනයන් අවම කිරීම සඳහා සිදු කරන ලද දැනුවත් කිරීම් ගණන 4. කාන්තාවන්ට හා ළමුන්ට එරෙහිව සිදුවන හිංසනය අවම කිරීම සඳහා සිදු කරන ලද වැඩසටහන් ගණන 5. ගෘහස්ථ හිංසනය වැළැක්වීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම යටතේ සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 6. ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 7. උපදේශන මධ්‍යස්ථාන වෙතින් සේවාවන් ලබා ගත් පිරිස 8. ඉදි කරන ලද පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ගණන			√
	දේශපාලන ,ආර්ථික සහ සාමාන්‍ය ජීවිතයේ සියළුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය හා සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම (5.5)	1. දේශපාලනයේ කාන්තාවන් බලගැන්වීමේ සහතිකපත් පාඨමාලාව හදාරන ලද කාන්තාවන් ගණන 2. පළාත්පාලන ආයතන කාන්තා නියෝජිතයින්ගේ කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ කාන්තාවන් ගණන 3. ඡන්ද දායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන			√
	කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව තාක්ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබාදීම (5b)	" සුහුරුලිය " වැඩසටහන යටතේ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුවත් කරන ලද කාන්තා ව්‍යවසායකයින් ගණන			√

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
	ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්වය සහ සියළුම මට්ටම් වල කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම සහ ශක්තිමත් කිරීම හා නීතිමය ලෙස බලාත්මක කිරීම (5 c)	1. කාන්තා ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම 2. ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තිය 3. ධනාත්මක ශික්ෂණය සඳහා වන "ශීක්ෂා" මාර්ගෝපදේශය 4. විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය			√
5.) සියල්ලන් සඳහාම පෝෂිත ,පර්පූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය,පූර්ණ,ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම (SDG 08)	බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කූට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම (8.7)	1.ලෝක ළමා ශ්‍රම දිනයට සමගාමීව පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 2.වීදි දරුවන්ගේ රැකවරණය හා සංවර්ධනය වෙනුවෙන් පවත්වන ලද වැඩසටහන් ගණන		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ :

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණ වැඩසටහනට අදාළව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අමාත්‍යාංශ මට්ටමින් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට 2017.01.27 වන දින සියලුම අමාත්‍යාංශ සඳහා 01/2017 දරණ චක්‍රලේඛය නිකුත් කිරීම.

- අමාත්‍යාංශ මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණ වැඩසටහන් ස්ථාපිත කිරීමට අදාළව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා 2017.02.17 වන දින දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- 01/2017 දරණ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශ මට්ටමින් නම් කරන ලද අතිරේක ලේකම්/ අධ්‍යක්ෂ සහ සංවර්ධන නිලධාරීන් මෙම වැඩසටහන සඳහා පුහුණු කිරීමට පුහුණු මොඩියුල 03ක් සකස් කිරීම හා පුහුණු වැඩමුළු 03 ක් පැවැත්වීම.

- 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් මඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාවය තහවුරු කිරීම උදෙසා පියවර ගැනීමට අදාළව 2017.07.10 දින ප්‍රධාන කාර්ය සාධක දර්ශක 12 ඇතුළත් ලිපියක් (KPI) ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කිරීම මඟින්, 2017.07.31 වන දින සියලුම අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථා හා මණ්ඩල ප්‍රධානීන් හට 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී එකී කාර්ය සාධක යොදාගන්නා ලෙස දන්වමින්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අංක BD/CBP/4/1/2 – 2018 චක්‍රලේඛය නිකුත් කරන ලදී.

- අමාත්‍යාංශ මට්ටමින් පත්කරන ලද කේන්ද්‍ර නිලධාරීන් පමණක් දැනුවත් කිරීම ප්‍රමාණවත් නොවන බැවින් සියලුම අමාත්‍යාංශවල තීරණ ගත හැකි මට්ටමේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය මත මේ වනවිට අප අමාත්‍යාංශය ඇතුළුව නීතිය හා සාමය අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන තුරන් කිරීමේ කමිටුව ස්ථාපිත කර ඇත.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණ වැඩසටහන් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිටු දැකීමේ කමිටු පිහිටුවීමට අදාළව රාජ්‍ය ආයතන වෙත ලබාදීම සඳහා අත් පොතක් සකස් කිරීමට කටයුතු කළ අතර මේ වන විට ඉංග්‍රීසි පිටපත මුද්‍රණ කටයුතු අවසන් කර ඇති අතර, සිංහල හා දෙමළ පිටපත් පරිවර්තන කටයුතු අවසන් කර ඇත.

- 2018 වසරේ අයවැය කැඳවීම් අවස්ථාවේ දී හඳුන්වා දුන් පරිදි ප්‍රධාන කාර්ය සාධක 12 හි ප්‍රගතිය, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ 02/2019 හරහා සෑම වසරකම ජුනි මස 30 වන දිනට සහ දෙසැම්බර් මස 31 වන දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතු බැවින් ඒ අනුව, මේ වර්ෂයේ ජුනි මස 30 ට ප්‍රගතිය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ලබා දී ඇත.

- ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙන් කළ දත්ත (Gender Disaggregated Data) සෑම රාජ්‍ය ආයතනයකින්ම ගෙන්වා ගැනීමටත්, එම දත්ත අප අමාත්‍යාංශයේ දත්ත පද්ධතියක් තුළට ඇතුළත් කොට පවත්වා ගෙන යාමටත් අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

- සියලුම පළාත් සභාවල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට අදාළ වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය ඇතුළත් මාර්ගෝපදේශය (GRB Guideline) මුදල් කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කර මේ වනවිට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

අභියෝග :

- බොහෝ විට ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති නිර්වචනය කිරීම සාම්ප්‍රදායික වර්ගීකරණය මත පදනම් වී තිබීම.
- ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් ස්ත්‍රී පුරුෂභාවය වශයෙන් වෙන් කළ දත්ත නොමැති වීම තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ගැටළුවක් වීම.
- වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය ප්‍රමාණවත් නොවීම.
- මධ්‍යම රජයේ සහ පළාත් සභාවල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය (Gender budgeting) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විගණන ක්‍රමවේදයක් (Gender Auditing) නොමැති වීම.

හයවන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	32	23	09
තෘතියික	17	14	03
ද්විතියික	1380	1159	221
ප්‍රාථමික	86	58	28
තාවකාලික	04	04	-

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

මෙම අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/ගණකාධිකාරී හා සැලසුම් සේවයේ අනුමත සේවක සංඛ්‍යාව වන 32 න් 09 දෙනෙකු පුරප්පාඩු පැවතුනද දැනට සිටින 23 දෙනාගෙන් එම කටයුතු ආවරණය කර ගන්නා බැවින්, එම ඇබෑර්තුවලින් ඇතිවන තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පසුබෑම අවම කර ගැනීමට හැකිවී තිබේ.

තෘතීයික කාර්ය මණ්ඩලයේ සිංහල/දෙමළ භාෂා පරිවර්තන නිලධාරී තනතුර පුරප්පාඩු බැවින් අමාත්‍ය මණ්ඩල සංදේශ/ වාර්ෂික වාර්තා බාහිර භාෂා පරිවර්තකයෙකු මඟින් ඉටුකර ගනු ලැබේ. මේ සඳහා ගෙවීම් කිරීමට සිදුවන අතර අමතර කාලයක් වැයවේ. උපදේශන නිලධාරී පුරප්පාඩුව 1938 කාන්තා උපදේශන සේවාවේ ලැබෙන ගැටළු සඳහා උපදෙස් ලබාදීමේ ක්‍රියාවලියේදී බාධාකාරී තත්ත්වයක් ඇතිකර තිබේ.

ද්විතික මට්ටමේ නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව 221 ක් වන අතර ඉන් හත්දෙනෙකු කළමනාකරණ සහකාර පුරප්පාඩු ද, ඉතිරි 214 ගෙන් 203 දෙනෙකු අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පවතින සංවර්ධන නිලධාරී පුරප්පාඩු 36 ක්, වනිතා සංවර්ධන නිලධාරී පුරප්පාඩු 14 ක්, උපදේශන සහකාර පුරප්පාඩු 112 ක් සහ අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයෙහි සංවර්ධන නිලධාරී තනතුරු පුරප්පාඩු 41 ක් ද වේ. මෙම පුරප්පාඩු උපාධිධාරී අභ්‍යාසලාභීන් බඳවාගනු ලබන අවස්ථාවලදී සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු සම්පාදනය කර ඇති අතර දැනට ප්‍රාදේශීය කාර්යාල මට්ටමේ ක්ෂේත්‍රයෙහි නියුතු නිලධාරී පුරප්පාඩු තනතුරුවල වැඩ ආවරණය සඳහා නිලධාරීන් යොදවා ඇත.

එසේ නමුත් උපදේශන සහකාර තනතුරු පුරප්පාඩු සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සපුරා ඇති උපාධිධාරීන් අමාත්‍යාංශය වෙත යොමු නොවීම ගැටළුවක්ව පවතී. මෙම තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම උපදේශන නිලධාරියෙකු විසින්ම සිදුකල යුතු අතර වෙනත් නිලධාරීයෙකු යෙදවීම ප්‍රායෝගික නොවන්නකි.

කාන්තා කාර්යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන රැකවරණ මධ්‍යස්ථානයන්හි ද්විතීක මට්ටමේ තනතුරුවලට අදාළව නේවාසිකාගාර පාලිකා පුරප්පාඩු 05 ක් සහ සහකාර නේවාසිකාගාර පාලිකා පුරප්පාඩු 05 ක් ද පවතින අතර අමාත්‍යාංශයේ පුස්තකාලයාධිපති පුරප්පාඩු 01 ක් ද වේ. එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම සිදු කරමින් පවතී.

ප්‍රාථමික නිලධාරී ගණය යටතේ රියදුරු පුරප්පාඩු 12 ක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 03 ක්, කම්කරු පුරප්පාඩු 01 ක් ද පවති. එසේම රැකවරණ මධ්‍යස්ථානයන්හි මධ්‍යස්ථාන සහායක පුරප්පාඩු 06 ක්, අරක්කැමි පුරප්පාඩු 06 ක් පවතින අතර, මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු ද සිදු කරමින් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)/ ඩොලර්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Workshop on Procument Procedure	02	දින 02	17,000	00	දේශීය	ප්‍රසම්පාදනය පිළිබඳව
සියළුම නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර නිලධාරීන්)	147	දින 06	750,000	00	දේශීය	කාර්යාල ක්‍රම/මුදල් රෙගුලාසි
රාජ්‍ය සේවකයින් සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන	02	දින 08	-	-	දේශීය	දෙමළ භාෂාව පිළිබඳ දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු'000)/ඩොලර්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
සියළුම කා.කා.සේ නිලධරයන් සඳහා පුහුණු වැඩසටහන	51	දින 02	260,000	00	දේශීය	තනතුරේ ස්වභාවය/ කාර්ය භාරය/ වගකීම *රාජ්‍ය වාහන ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම
රාජ්‍ය සේවකයින් සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන	02	දින 06	-	-	දේශීය	දෙමළ භාෂාව පිළිබඳ දැනුම
Enhance the ICT Computer knowledge of public sector officers	02	දින 08	-	-	දේශීය	පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම
Cross Regional workshop on strengthening gender Mainstreaming in the criminal justice reposes to violent extremism leading to Terri sum in Asia	02	දින 03	-	ඩොලර් 1270 පවුම් 75	විදේශීය	Gender
Early Childhood Development Asia-2019	01	දින 13	-	ඩොලර් 1000 පවුම් 75	විදේශීය	දරුවන් ගේ ආරක්ෂාව

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු'000) /ඩොලර්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Australia Awards Scholarship 2019	02	වසර 02	-	ඩොලර් 600	විදේශීය	කාන්තාවන්ගේ ආරක්ෂාව
Empowerment of for Rural Development - 2019	02	දින 28	-	ඩොලර් 2320 පවුම් 150	විදේශීය	ග්‍රාමීය සංවර්ධනය
Study Tour Program	01	දින 10	-	ඩොලර් 226	විදේශීය	කාන්තා ආරක්ෂාව සම්බන්ධ අධ්‍යයනය
Sixty Third Session Commission for the state of women UN – New York	01	දින 11	-	ඩොලර් 4140 ගුවන් ටිකට්පත් ගාස්තු රු.181,500 .00	විදේශීය	කාන්තාවන්ගේ ආරක්ෂාව
Empowering women unigram workers for South Asia Women's care	01	දින 02	-	-	විදේශීය	වැඩ කරන කාත්තාව
81st session of the committee of child Right	01	දින 08	-	ඩොලර් 3720 පවුම් 75	විදේශීය	ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
Understanding promotion sensitive value gain South Asia	01	දින 06	-	ඩොලර් 200	විදේශීය	කාන්තා උපදේශනය
SAARC technical consolation childhood and women nutrients	01	දින 04	-	ඩොලර් 120	විදේශීය	කාන්තාවන්ගේ හා ළමුන්ගේ පෝෂණය
IORA mode razing trade in the Indian Ocean Rim	01	දින 05	-	ඩොලර් 240 පවුම් 75	විදේශීය	ඉන්දීය සාගර වෙළඳාම

	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු'000) /ඩොලර්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
The Regional parliamentarian meeting on the prevention on violence against women and Girls	01	දින 02	-	ඩොලර් 160	විදේශීය	කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය
Management of Rural employment project and poverty alleviation Unicef high level politician Forum	01 01	දින 34 දින 04	-	ඩොලර් 1160 ඩොලර් 3025	විදේශීය	ග්‍රාමීය සේවා නියුක්තිය/ දුප්පත්කම දේශපාලන සමුළුව
Samuel training for leaders from south East Asian peters counseling	01	දින 04	-	ඩොලර් 400	විදේශීය	කාන්තා නායකත්වය
Cross country learning workshop on gender responsive budgeting	01	දින 04	-	ඩොලර් 160	විදේශීය	Gender responsive budgeting
2019 executive program education development	02	දින 06	-	ඩොලර් 160	විදේශීය	අධ්‍යාපන සංවර්ධනය
Vacation development program for women	01	දින 12	-	ඩොලර් 560	විදේශීය	කාන්තාවන්ගේ ආරක්ෂාව
Capacity development for women leader ship	01	දින 19	-	ඩොලර් 840	විදේශීය	කාන්තා නායකත්වය
Administration capacity development & women policy	02	දින 20	-	ඩොලර් 1680	විදේශීය	කාන්තා ප්‍රතිපත්තිය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු'000) /ඩොලර්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Development seminar on chains development experience and its perform and opening up politics	01	දින 30	-	-	විදේශීය	චීන සංවර්ධන අත්දැකීම්
Pre- technical event sexual and reproduction	01	දින 09	-	ඩොලර් 200	විදේශීය	ප්‍රජනනය ලිංගිකත්වය
Global early childhood workforces meeting	01	දින 05	-	ඩොලර් 200	විදේශීය	Early childhood
JICA-CO-CREATION PROGRAMME	01	දින 19	-	ඩොලර් 840	විදේශීය	කාන්තා ආරක්ෂාව
Seminar on building smart cities under belt and initiative in china	01	දින 20	-	ඩොලර් 840	විදේශීය	Building smart cities
Seminar economic Globalization	01	දින 22	-	ඩොලර් 840	විදේශීය	ආර්ථික ගෝලීයකරණය
2019 international seminar forum	01	දින 04	-	ඩොලර් 120	විදේශීය	කාන්තා හා ළමා රැකවරණය
Gender focal point	01	දින 03	-	ඩොලර් 375	විදේශීය	කාන්තා හා ළමා වැඩසටහන

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු'000) /ඩොලර්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
Invitation to global workshop on united nation Globalization Program	01	දින 02	-	ඩොලර් 160	විදේශීය	-
WPGA Global summate Addis ABABA Ethiopia	01	දින 03	-	ඩොලර් 2325	විදේශීය	-

හත්වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් ප්‍රකාශ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිනුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්			
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 276/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ (යාවත්කාලීන කරමින් පවත්වාගෙනු යනු ලැබේ).		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ (සකසා ඇත)		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ (සකසා ඇත)		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ (සකසා ඇත)		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් සඳහා පිලිතුරු ලබාදී තිබීම	සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු ලබාදී ඇත.	(සමහර විමසුම් සඳහා පිළිතුරු ලබාදීමේදී ප්‍රමාදයක් සිදුවී ඇත)	

6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	සකස් කර ඇත (අනුකූල වේ)		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගනන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	ඉදිරිපත් කර ඇත (අනුකූල වේ)		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	ඉදිරිපත් කර ඇත (අනුකූල වේ)		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	පවත්වන ලදී (අනුකූල වේ)		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විදිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ (අතිරික්තතා පොත්වලට ඇතුළත් කර ඇත. ඌණතා සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී)		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අපහරණ කටයුතු සිදු කරමින් පවතී		
9	වාහණ කළමනාකරණය			
9.1	සංචිත වාහන සහ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	සිදුකරමින් පවතී		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ (සිදු කරමින් පවතී)		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	පවරාගෙන තිබේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැම්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස්කර තිබූ අදායම් තැම්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2008 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදන කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරිම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කොට තිබීම	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		